ජනාධිපති කාර්යාලය
சனாதிபதி அலுவலகம்
PRESIDENTIAL SECRETARIAT

චක්‍රලේඛ අංක - PS/DSP/DPU/07/18

මගේ අංක - PS/DSP/DPU/01/02/02

2018 ජුනි මස 12 වැනිදා

**සියලුම අමාත්‍යාංශ ලේකම්වරුන්**

**සියලුම පළාත් ප්‍රධාන ලේකම්වරුන්**

**සියලුම රාජ්‍ය අමාත්‍යාංශ ලේකම්වරුන්**

**සියලුම දිස්ත්‍රික් ලේකම්වරුන්**

**සියලුම පළාත් අමාත්‍යාංශ ලේකම්වරුන්**

**සියලුම දෙපාර්තමේන්තු ප්‍රධානීන්**

**සියලුම රාජ්‍ය සංස්ථා ව්‍යවස්ථාපිත මණ්ඩල ප්‍රධානීන්**

**සියලුම පළාත් පාලන ආයතන ප්‍රධානීන්**

**මත්ද්‍රව්‍ය නිවාරණ ජාතික සතිය ප්‍රකාශයට පත්කිරීම**
**(2018.06.26 සිට 2018.07.02 දක්වා )**

මද්‍යසාර හා දුම්වැටි භාවිතය හේතුවෙන් වසරකට ශ්‍රී ලාංකිකයින් 36,000 ට අධික ප්‍රමාණයක් මිය යයි. එසේම මද්‍යසාර හා දුම්වැටි සඳහා වසරකට රුපියල් කෝටි 18,250 කට අධික මුදලක් ශ්‍රී ලාංකිකයන් වැය කරනු ලබන අතර මත්ද්‍රව්‍ය හා දුම්වැටි භාවිතයෙන් රෝගී වූ පුද්ගලයන් සුවපත් කිරීම සඳහා වැය වන සෞඛ්‍ය වියදම එම මුදල මෙන් තුන් ගුණයකට අධික වේ. මෙතරම් විශාල ව්‍යසනයක් සිදුකරන මද්‍යසාර, දුම්වැටි හා අනෙකුත් මත්ද්‍රව්‍ය නිසා සිදුවන සමාජීය හානියද අතිමහත්ය.

02. මෙම මත්ද්‍රව්‍ය ව්‍යසනයෙන් ලංකාව මුදාගැනීමේ අරමුණින් ක්‍රියාත්මක, අතිගරු ජනාධිපතිතුමන්ගේ **"මතින් නිදහස් රටක්"** ජාතික වැඩසටහන යටතේ අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලය හා මත්ද්‍රව්‍ය නිවාරණ ජනාධිපති කාර්යය සාධන බලකායට සම්බන්ධිත අනෙකුත් පාර්ශවකාරී ආයතන සමඟ එක්ව "මත්ද්‍රව්‍ය භාවිතය හා නීතිවිරෝධී ප්‍රවාහනයට එරෙහි ජාත්‍යන්තර දිනය"ට සමගාමීව 2018.06.26 සිට 2018.07.02 දක්වා කාලය "මත්ද්‍රව්‍ය නිවාරණ ජාතික සතිය" ලෙස ප්‍රකාශයට පත්කර ඇත.

03. ඒ අනුව, මෙකී කාල පරිච්ඡේදය තුළ ඔබ ආයතනය තුළ හා ඊට අනුබද්ධිත සියලුම ආයතනයන්හි පහත සඳහන් ක්‍රියාකාරකම් සිදු කිරීමට අවශ්‍ය පියවර ගන්නා ලෙසත්, ක්‍රියාත්මක වැඩසටහන්හි ප්‍රගතිය psdp@presidentsoffice.lk වෙත ඉදිරිපත් කිරීමට කටයුතු කරන ලෙසත් කාරුණිකව දන්වමි.

I. දුම්පානය හා මද්‍යසාර පිළිබඳ රූපමය අවවාද ඇතුළත් පුවරු ආදිය ආයතන පරිශ්‍රයේ ප්‍රදර්ශනය කිරීම. (www.drugfree.gov.lk වෙබ් අඩවියෙන් මෙන්ම Presidential Task Force On Drug Prevention හා Sonduru Minisun යන ෆේස් බුක් පිටු මගින් ලබාගත හැක.)

II. **ශ්‍රී ලංකා පොලීසිය** - සියලුම ප්‍රජා පොලිස් කමිටු මෙම සතිය තුළ සක්‍රීය කිරීම හා ප්‍රගතිය වාර්තා කිරීම.

ගාලු මුවදොර, කොළඹ 01
காலி முகத்திடல், கொழும்பு 01
Galle Face, Colombo 01
දුරකථන / தொலைபேசி / Telephones ++ 94 (0) 11 2354418 ++ 94 (0) 11 2473873
ෆැක්ස් / தொலைநகல் / Fax ++ 94 11 2446657
ඉ-තැපෑල / மின்-அஞ்சல் / e-mail prsec@presidentsoffice.lk